

# වම් ඉවුරේ මිනිස්සු

රාජාංගනේ මතක සටහන්

## බුලත් උපත මට කියලා දී මිස බුලත් වට්ටියට අත නොතියං

කොයින් මාමාගෙ පින්කමට අපි හාමුදුරු-වන්ටත් ආරාධනා කළා. අනිත් කළමණාත් ලෑස්ති කර ගත්තා. ඒ කතාවනෙ අපි කියමින් හිටියෙ. මාස දෙකක නිහඬතාවකින් පස්සෙ වම් ඉවුරෙ මිනිස්සුන්නෙ කතාව කියන්නයි ආයෙම අපේ සූදානම.

මතකද කොයින් මාමා අන්තිමට කිව්ව කවිය?

වාන් ඇළේ පා කරමින් දාඩිය ලේ කඳ
හේන් ඉමේ සටන් කරපු මාර සෙනග බිඳ
යාන් වෙච්ච කිරි කුරහන් යායේ හරි මැද
කෝන් හෙවනෙ බුදු වේවා අප්පුච්චා අද

මේ කවිය අහපු මම ඒ ගැන කල්පනා කරමින් සිටියා. මගේ නිහඬ බව දුටු කොයින් මාමා කටහඬ අවදි කළා.

බොගෙ ඇගේ පතේ රුදාව ඇල්ලුවාද? අද සුලු අරින්ට වේලාවක් නැතුවා.. ඒක සීරුවට ගිඩි ගිඩිය කරකැච්චාවෙ..

නැතුවා මාමා.. කල්පනා කොරුච්චෙ තව කරන්ට කාරි එමටයි..

ඒවා ඉස්ගෙඩියෙ හිරකොරගන්නෙ අහවල් එකටැයි.. අපි පුලු පුලුවන් විදියට කොරගමු..

මාමා උඹ හෙටම හේන් ඉම එකාලගෙ කන් හොරොව්වට දිගේලි කරපන් මේ කාරණාව.. මං ලී දඬු ටිකක් ලෑස්ති කරන්නං.. මිලිටරි රෙද්දෙ වහුං කරන්ට පුලුවන් තරමට පැලක් අටෝපං.. ලොකු හැලි වලං ලිප තියන්ට ලිග්ගල් ටිකක් හරි කරපං.. අපි හේන් ඉම එකාලට හාමුදුරුවො බණට වඩින්ට කලියෙන් අඩුක්කු තනන්ට ඕනෙ.. ඒකෙ අඩුම කුඩුම මං ලක ලෑහැත්ති කරඤ්ඤං.. අනික් හරිය උඹ බලා ගනිං...

බෝ මේවා කරට ගෙන විය පැහැදං කරලා කාසි පනං හිඟ වුණොත් මහ එවුවෝ බොට දොස් තියයි..

අපේ අප්පුච්චලා මේ වගේ දේවල් කරන්ට හරි මනාපයි.. උන්දැලගෙ කනෙත් තිබ්බනං උන්දැලත් එයි..

ඒකනං අපුරුයි.. ඒත් මේ පැල් කොටේ ඉඩ පාඩු නැතුවා.. කොහේ කියලා කුඳ ගහන්ටද? ඇන තියාගන්ටද? අඩුවක් නින්දාවක් වුණොත් මගේ පපු කැනැත්තට වාරු නැතිවෙයි.. ඒ ඇත්තන්ට මදි පුංචිකම් වෙනවට මං මනාප නැතුවා.. පුලුවං විදිහට අපි එකලහක් කරමු.. ඕං උලමත් ආඝිරිගානවා.. තියෙන දෙයක් ගිල දාලා ඇතුල් පිල ඇලවෙයං.. මං එලිබහින්ඩ යනවා..

නිශාචරයින්ගේ හඬ තෝරා බේරා ගැනීමට උත්සාහ ගනිමින් උන් මා වෙත නින්ද ආවේ කොයි වේලාවේද නොදනිමි. මැණිකාගේ හඬින් මා අවදි වන විට කොයින් මාමා වී මල්ලත් ඉහට ගෙන මිදුලටත් බැහැලා.

මූණ කට පිහදාගෙන හීල ගිලදාපන්.. මං යනවා කැකුලං ගහන්ට.. අද ඉර මුවා-වෙන්ට කලින් හේන් ඉම එකාලගෙ කන් හොරොව්වට දිගේලි කොරඤ්ඤං පිංකොම ගැන... අදවත් කල් වේලා ඇතිව පිලට ගොඩ වෙය නිස්කාංසුවේ ඉන්ට..

මැණිකා - අප්පච්චි උඹට සුනංගුයි.. කනට ගනිං උඹෙ බත.. අරකි වැට ඉමෙන් කරපොචපු ගමන් වේල අවේලාව නොබලා පස්සෙං වැටෙයි දවසේ කාරි නිනව් නැතුව..

නවත්තල තොගෙ සිලපේදිරිය මෙහෙ ගෙන ඔය දිය පොල්කටුව.. මං කිව්වා.

විගැහින් උනු උනුවේ බෙලිමල් වතුර ගිලදාන මා දුටු මැණිකා මවාගත් තරහකින් මා විමසුවේ කොහෙ යන්ටද අඩා මේ ලහි.. ? කියලයි

මං වැවෙන් මූන කට හෝදා ගෙන වාඩියට යනවා.. වාඩියේ එකාල පන්සලට එක්ක යන්ට ඕනෑ..

එතකොට හීළ ගිලදාන්නෙ නැතුවා..?

වාඩියෙ එකාල මොනවා හරි තම්බලා නැතුවයැ..

අහවල් එකටද ඕකලාගෙ බත ගිලින්නෙ..? මං ගං කරෝල හොඳියි මිලු බතුයි කොච්චි පොල් දෙහි ඇඹුලෙන් අඹරලා තියෙනවා. මූණ කට පිහදා ගෙන රිස්ස යනකං ගිල දාපං.... මං යනවා ඩිංගිරි අම්මා බලන්ට..

මූන කට සෝදා ගෙන මිලු බත පතට බෙදා ගෙන පිල උඩ වාඩි වුනා විතරයි මලිත්ති එකී නගා එක්ක පැලට ගොඩ වුණා.

මොකෑ නගා මේ උදහැනැක්කෙ? මී හරකි ගානට හති හලාගෙන?

පය ඉක්මන් කරා අයියණ්ඩි උඹ හීල ගිලදාන්ට කලින්.. මැණිකෙ අක්ක කියැව්වා මිලු බත් තැනුවා කියලා. වෙල් අල කොල ඇඹුල ඒකට අපුරුයි.. මං ඇන්න ආවා..

උඹට පිං.. මේකට ඩිංගක් දාපන් නගා..

අර මොකෑ ඩිංගිත්තක්.?

ටිකක් ඉතිරි කර කොයින් මාමාට..

උන්දෑ මේවයෙ රහ නොදන්නවයැ..

ඒවෑයින් බොට කාරි නැහැ... ඩිංගක් ඉතිරි කර.. මොකෑ බෝ පැංචි මූන එල්ලගෙන?

මේකිට විතරද පින්..? මට නැතුවා..? මං ඒකි පස්සෙන් තනිවට වැටුණා.. පැංචි නෝක්කඩු කිව්වා.

මෙහෙං ඉඳ ගං... බොට තමා ගොඩක් පින්..

ඒ මොකැයි..?

බෝ අක්කණ්ඩි එක්ක මට කෑම උහාගෙන ආවා.. අක්කණ්ඩිගෙ තනියට පස්සෙං වැටුණා.. ඉතින් උඹට ගොඩක් පින්.. අක්කණ්ඩි කෑම විතරයි ගෙනාවෙ.. ඒ නින්දා ඒකිට ටිකයි පින්..

කතා කරමින් කෑම ගත් නිසා කෑම පිට උගුරේ ගොස් කැස්සක් ඇති විය.

ගනින් නගා ඔය දිය ඩිංගිත්තක්..

නවත්තත ගනිං තිගෙ වාදම.. අය්යණ්ඩි අඩුක්කුව ගිල දානකං.. හීන් සීරුවේ ගිල දාලා අයියණ්ඩි වෑ කණ්ඩිය ඉස්මත්තට වරෙන්... අපි එතකං ගඩා ගෙඩි ටිකක් එක්කහු කරන්නං..

මේ කූටකේ බැද්දෙ රිංගන්ඩ කාරි නෑ නගා.. මට පන්සලට යන්ට තියෙනවා..

හැබෑද අයියණ්ඩි උඹ පන්සල හරි කරනවා කියන්නෙ?

ඔව් නගා...

උඹට ජාති ජාතිත් පින්.. අපේ එකාලට වැඳගන්නට තියෙන තැන හරි කරලා දෙනවද...

හාමුදුරුවෝ මේ පැලට වඩින්ට කලින් ඒක අහවර කරන්නට ඕනෙ..

මෙහෙ කරන්ට තියෙන දෙයක් ගමේ එකාල අඩුවක් නැතුව හරි කරයි.. අය්යණ්ඩිට තියෙන්නෙ ඒකලාට කෙට්ටිසන් දෙන එක විතරයි..

ඉඳා නගා මේ මඩක්කුව තියාපං.. ගනිං ඔය බුලත් වට්ටිය මෙහාට..

පැංචි - බුලත් වට්ටියට අත තියන්ට කලින් මං දිගේලි කරන පද පේලියට උත්තර බැඳපං අය්යණ්ඩි..

මේකි අය්යණ්ඩි එක්කමයි අරෝවට යන්නෙ.. ඔහේ දිගේලි කරන්නට කිය.. මාත් නොදන්වැයි පද පේලි.. ඕං කන දී අයියණ්ඩි..

පළමුව මේ කප උපන්න කාලෙදි බුලත් ගෙනාවේ කවුද කියං
දෙවනුව මහරජ සම්මත වංසෙට බුලත් ගෙනාවේ කවුද කියං
පත්තිනි පා ළඟ කුමරුට දෙන දූ බුලත් බෙදුවේ කවුද කියං
බුලත් උපත මට කියලා දී මිස බුලත් වට්ටියට අත නොතියං

කැලේ දෙයියන්ටම පෙනීයං.. මේකි මට බුලත් තහංචිය කෙරෙව්වා.. හෙනං මටත් කන දී පැංචි...

පළමුව මේ කප කසිනා කාලෙදි බුලත් ගෙනාවේ නාග ලොවින්
දෙවනුව මහ සම්මත රජ වංසෙට බුලත් ගෙනාවේ නාග රජුන්
පත්තිනි පා ළඟ කුමරුට දෙන දා බුලත් බෙදුවේ දළ කුමරුන්
බුලත්උපත මම කිව්වා ඇති දැන් බුලත් වට්ටිය මගෙ අතට දියං

සීවරං දෙයියනේ .. ඇස්වහක් කටවහක් නෑ.. මේං බල අක්කන්ඩි උත්තර බැන්ද අපුරුව..

බෝගල


**වැඩි පිරිසක් අතරට ඔබේ දැන්වීම ගෙනයන්න**

සන්නස වෙළඳ දැන්වීම් සඳහා විමසන්න

03 8707 4604 - 0402 025 516

**email** sannasanews@gmail.com / ads.sannasa@gmail.com

LANKAN AUTO CARE

Licensed Roadworthy Tester (R.W.C)



ALL MECHANICAL REPAIRS

LOG BOOK SERVICE | ELECTRICAL REPAIRS

AUTO TRANSMISSIONS | BRAKES & CLUTCHES

FUEL INJECTION | COMPUTER DIAGNOSTIC




Ranjith Perera

Mob: 0409 866 886

9798 2200

14/30 Tower Court

Noble Park 3174